# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

2053/33 – 2018 ජනවාරි 11 වැනි බ්‍රහස්පතින්දා – 2018.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, පාතේගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/ ඩීකේඩබ්ලිව්/2017/158 හා 2017.07.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0510**

උතුරට: මාර්ගය, නිශාන්ත හේරත් හිමිකම් කියන මලවිගෙවත්ත සහ හිමිකරු සොයාගත නොහැකි මලවිගෙවත්ත; නැගෙනහිරට: නිශාන්ත හේරත් හිමිකම් කියන මලවිගෙවත්ත සහ හිමිකරු සොයාගත නොහැකි මලවිගෙවත්ත; දකුණට: කැබලි අක්ෂර සී, සවුන්ද්‍රා හැන්නදිගේ දුලානි, සවුන්ද්‍රා හැන්නදිගේ රංජනී සහ අළුත් ගෙයි චන්ද්‍රකුමාර හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත; බටහිරට: සවුන්ද්‍රා හැන්නදිගේ දුලානි, සවුන්ද්‍රා හැන්නදිගේ රංජනී සහ අළුත් ගෙයි චන්ද්‍රකුමාර හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත, පාලුවත්ත සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1677**

උතුරට: කුසුමාවතී අමරවීර හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත; නැගෙනහිරට: අළුත් ගෙයි චන්ද්‍රකුමාර, සවුන්ද්‍රා හැන්නදිගේ රංජනී සහ සවුන්ද්‍රා හැන්නදිගේ දුලානි හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත; දකුණට: කැබලි අක්ෂර සී සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ කුසුමාවතී අමරවීර හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත.

03. **කැබලි අක්ෂර 'සී' – මානගල්ලෙගෙවත්ත නොහොත් යාපාගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.9136**

උතුරට: මාර්ගය, කැබලි අක්ෂර බී, සවුන්ද්‍රා හැන්නදිගේ දුලානි, සවුන්ද්‍රා හැන්නදිගේ රංජනී සහ අළුත් ගෙයි චන්ද්‍රකුමාර හිමිකම් කියන කිරිඅඹේවත්ත, එගොඩවත්ත සහ පාලුවත්ත, කැබලි අක්ෂර ඒ, හිමිකරු සොයාගත නොහැකි මලවිගෙවත්ත සහ සිරිපාල වික්‍රමතුංග හිමිකම් කියන මලවිගෙවත්ත; නැගෙනහිරට: හිමිකරු සොයාගත නොහැකි මලවිගෙවත්ත

1A – G26928 – 32 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සහ සිරිපාල වික්‍රමතුංග හිමිකම් කියන මලවිගෙවත්ත සහ ධර්මපාල කංකානම්ගේ සෝමාවතී හිමිකම් කියන මහවිදානගෙදන්ගහලියද්ද; දකුණට: ධර්මපාල කංකානම්ගේ සෝමාවතී හිමිකම් කියන මහවිදානගෙදන්ගහලියද්ද සහ හේවා දූලිගේ සිරිපාල හිමිකම් කියන මානගල්ලෙගෙවත්ත; බටහිරට: හේවා දූලිගේ සිරිපාල හිමිකම් කියන මානගල්ලෙගෙවත්ත සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2016/වීඊ/461.
2017 නොවැම්බර් මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 -734

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, බඹරැන්ද මධ්‍යම ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2017/54 හා 2017.07.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.1463ක් වන අක්ෂර 'ඒ' වශයෙන් දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගනේගොඩයාවත්ත – ප්‍රමාණය: හෙක්. 1.1463**
උතුරට: ආරියරත්න කස්තුරිආරච්චි හිමිකම් කියන පැලරුප්ප, ඇළ සහ කුඩාගම ලියනගේ කුමාර හිමිකම් කියන මහඅඹගහකොරටුව; නැගෙනහිරට: කුඩාගම ලියනගේ කුමාර හිමිකම් කියන මහඅඹගහකොරටුව සහ මාර්ගය; දකුණට: හේවාපස්සපෙරුමගේ ඥානවතී හිමිකම් කියන කඩක්කුට්ටිගෙවත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.), මාර්ගය, ආරියසේන ලියනගේ හිමිකම් කියන ගනේගොඩයාවත්ත සහ ආරියරත්න කස්තුරිආරච්චි හිමිකම් කියන පැලරුප්ප.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2015/වීඊ/38.
2017 දෙසැම්බර් මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 -735

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, වල්හපුතැන්න (157 එච්) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වල්හපුතැන්න (අ.ග.පි.295) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/ එච්එල්ඩී/ 2016/407 හා 2017.03.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වල්හපුතැන්නේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0535ක් පමණ**
උතුරට: අ.ග.පි. 295 හි කැබලි අංක 38 සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: අ.ග.පි. 295 හි කැබලි අංක 38; බටහිරට: අ.ග.පි. 295 හි කැබලි අංක 38 සහ 42.

02. **කැබලි අක්ෂර බී' – වල්හපුතැන්නේ පතන – ප්‍රමාණය: හෙක්. 0.2070ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ අ.ග.පි. 295 හි කැබලි අංක 38, 119, 222, 223 සහ 120; නැගෙනහිරට: අ.ග.පි. 295 හි කැබලි අංක 119, 222, 223 සහ 120; දකුණට සහ බටහිරට: අ.ග.පි. 295 හි කැබලි අංක 37, 38 සහ කැබලි අක්ෂර ඒ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/361.
2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 736

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.